සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

06 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2022(2023) | **62 S**

නම: ..... | **පුරවැසි අධ්‍යාපනය** | **කාලය පැය දෙකයි**

• **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.** **I කොටස**

• **ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුලින් තෝරා හිස්තැන් පුරවන්න.**
(ආකල්ප / විදුහල්පතිතුමා / අනධ්‍යයන / ලොග් සටහන්/ කළමනාකරණ)

01) පාසලේ ඉතිහාසය ඉගෙන ගැනීම සඳහා .....පොත භාවිතා කළ හැකිය.

02) පාසලේ පාලනයට සම්බන්ධ ප්‍රධානියා ..... වේ.

03) පාසල් සිසුන් දැනුම, කුසලතා හා ..... වලින් සංවර්ධනය කිරීම ගුරුවරුන්ගේ වගකීමක් වේ.

04) පාසල් භූමියේ පවිත්‍රතාවය හා අලංකාරය පවත්වාගෙන යාමට සහයවීම ..... කාර්යමණ්ඩලයේ වගකීමකි.

05) පාසල් සංවිධාන ව්‍යුහය තුළ පවත්නා පාසල් ..... කමිටුව පාසලේ පරිපාලන කටයුතු වලට බෙහෙවින් උපකාරී වේ.

• **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06) පුද්ගලයා තුළ පවතින දක්ෂතාවලින් උපරිම ඵල නෙලාගත හැකි වනුයේ ජීවිත ස්වභාවය තේරුම් ගෙන ඒවා තම දක්ෂතා හා සම්බන්ධ කරගැනීමෙනි. (.....)

07) අලසකමින් අවේගශීලි බවින් යුතුව කටයුතු කිරීමෙන් පුද්ගලයකු තුළ පවත්නා දුර්වලතා අවම කරගත හැකිය. (.....)

08) විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයින්ගේ අත්දැකීම් හා දැනුම ලබාගැනීමෙන් පුද්ගලයෙකු සතු හැකියා හා දක්ෂතා වැඩිදියුණු කර ගත හැකිය. (.....)

09) පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබ තුළ යහපත් අරමුණු ඇතිකරගැනීම ඔබේත් සමාජයේත් විනාශයට හේතුවේ. (.....)

10) ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතුවල නිරත වන ශිෂ්‍යයෙකුට තම සහජ කුසලතා වර්ධනය කරගැනීමට අවස්ථාව උදාවේ. (.....)

• **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11) 6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන රුචිරට ඔහුගේ සම්පූර්ණ නම නිවැරදිව දැනගැනීම සඳහා අනුගමනය කළ යුතු වඩාත් නිවැරදි ක්‍රියාමාර්ගය මින් කුමක්ද?
1. පංතිභාර ගුරුතුමියගෙන් විමසීම.
2. පංති නාමලේඛණය පරීක්ෂා කර බැලීම.
3. උප්පැන්න සහතිකය පරීක්ෂා කර බැලීම.
4. ඥාතියෙකුගෙන් විමසීම.

12) සැලසුම් සහගත ශිෂ්‍යයෙකු තුළ දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?
1. තම අරමුණු ඉටුකරගැනීම.
2. වැඩකල් දැමීම.
3. පසුතැවීමෙන් කටයුතු කිරීම.
4. මානසික ආතතිය ඇතිවීම.

13) පාසල් ගීය ගායනා කිරීමේදී ප්‍රදර්ශනය කළ යුතු නිවැරදි ඉරියව් පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. මින් වඩාත් නිවැරදි ඉරියව්ව වන්නේ,
1.පහසුවෙන් සිටිමින් ගායනා කිරීම.
2. ජංගම දුරකථනය භාවිතා කිරීම.
3. පාසල් ගීතයට අගෞරව වන ලෙස ගායනා කිරීම.
4. සීරුවෙන් සිටිමින් තාලානුරූපව ගායනා කිරීම.

14) ශ්‍රී ලංකාවේ පරිපාලන බෙදීම් අනුව කුඩා ම පරිපාලන ඒකකය වන්නේ මින් කුමක්ද?
1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
2. ග්‍රාම නිලධාරී කොට්ඨාශය
3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය
4. පළාත්සභා බල ප්‍රදේශය

15) හිරුඑළිය, වාතය හා ජලය යන භෞතික සම්පත්වලින් ලබාගන්නා ප්‍රයෝජනයක් වන්නේ,
1. ප්‍රවාහනය සඳහා භාවිතා කිරීම.
2. කෘෂි කර්මාන්තය සඳහා භාවිතා කිරීම.
3. බලශක්තිය නිපදවීම සඳහා භාවිතා කිරීම.
4. පානීය ජල අවශ්‍යතා සඳහා භාවිතා කිරීම.

• ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.

16) A පින්තූරයෙන් දැක්වෙන පුද්ගලයා නම්කරන්න.

.....

17) ඔහු හැඳින්වෙන අන්වර්ත නාමය ලියන්න. .....

18)

රූපයේ දැක්වෙන අවස්ථාවකට ඔබ සම්බන්ධ වූ විට ඔබ තුළ වර්ධනය වන ගුණාංග දෙකක් ලියන්න.

.....

.....

19) එවැනි අවස්ථාවකදී ඇතිවිය හැකි අනතුරු දෙකක් ලියන්න.

.....

.....

20) පින්තූරයෙන් දැක්වෙන අවස්ථාව හැර පාසල් ශිෂ්‍යයෙකු තුළ පවත්නා දක්ෂතා සංවර්ධනය කර ගැනීම සඳහා පාසලෙන් ලැබෙන වෙනත් අවස්ථා දෙකක් ලියන්න.

.....

..... (ල.20×2 = 40)

II කොටස

• පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
• පළමු ප්‍රශ්නයට ලකුණු 16ක්ද 02 සිට 07 දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින් ද හිමිවේ.

01) පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.
i. පාසලේ ඉතිහාසය ඉගෙන ගැනීම සඳහා භාවිතා කළ හැකි ලේඛනයකි ඇතුලත්වීමේ ලේඛනය. එම ලේඛනයේ ඇතුලත් කරුණු තුනක් ලියන්න. (ල.03)
ii. පාසලක වැදගත්ම මානව සම්පත ශිෂ්‍ය ප්‍රජාවයි. ශිෂ්‍යයන්ගෙන් පාසලට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න. (ල.02)
iii. පාසල් සංස්කෘතියට අයත් අංග 03ක් නම් කරන්න. (ල.03)
iv. 6 ශ්‍රේණියේ ඉගෙනගන්නා පාසල් ශිෂ්‍යයෙක් වන ඔබ තුල පවත්නා දක්ෂතා දෙකක් හා දුර්වලතා දෙකක් ලියන්න.
දක්ෂතා ....
දුර්වලතා..... .....(ල.04)
v. ඔබේ පාසලේ ආදර්ශ පාඨය ලියන්න. (ල.02)
vi. පාසල් කොඩිය ඔසවන අවස්ථා දෙකක් ලියන්න. (ල.02)

02) i. පාසලක සංවිධාන ව්‍යුහයේ දළ සැලැස්මක සටහනක් පහත දැක්වේ. එහි හිස්තැන් නිවැරදිව සම්පූර්ණ කරන්න. (ල. 04)



ii. පාසල් සංවිධාන ව්‍යුහයක් පැවතීමේ වාසි දෙකක් ලියන්න. (ල. 04)

iii. පාසල් සංවිධානය ව්‍යුහයක ඇති වෙනත් කමිටු තුනක් ලියන්න. (ල. 03)

03) i. ඔබට අධ්‍යයන කටයුතු කරගෙනයාම සඳහා හා ඒවා වර්ධනය කරගැනීමට රජය සපයා ඇති පහසුකම් තුනක් ලියන්න. (ල. 03)

ii. ඔබ භුක්ති විඳින අයිතිවාසිකම් තහවුරු වන්නේ, ඔබ විසින් ඒ වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් ඉටුකිරීමෙනි. පහත දැක්වෙන අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

අයිතිවාසිකම්	යුතුකම්
අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය.	1 ..... 2 .....
සහෝදර සිසු සිසුවියන් ඇසුරු කිරීමට ඇති අයිතිය	1 ..... 2 .....

(ල.08)

04) i. ඔබ ප්‍රදේශයේ ඇති භෞතික සම්පත් කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න. (ජලය, කඳු, මංමාවත්, පාලම්, ගංගා, හිරු එළිය, ගොඩනැගිලි, වාහන)

ස්වාභාවික භෞතික සම්පත්	ස්වාභාවික නොවන භෞතික සම්පත්

ල.04)

ii. භූමිය සමාජ අවශ්‍යතා සඳහා යොදාගන්නා අවස්ථා දෙකක් සහ ආර්ථික අවශ්‍යතා සඳහා යොදාගන්නා අවස්ථා දෙකක් ලියා දක්වන්න. (ල.04)

iii. භෞතික සම්පතක් වන භූමිය සංරක්ෂණය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් ලියන්න. (ල.03)

05)

A B C D E F

I. ඉහත දැක්වෙන මානව සම්පත් ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

බුද්ධිමය හැකියා	කායික හැකියා

(ල.06)

ii. මානව සම්පත් වර්ධනය කරගැනීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වන ආයතන දෙකක් ලියන්න. (ල.02)

iii. මානව සම්පත විධිමත්ව පුහුණු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න. (ල.03)

06) i. සමාජයේ ජීවත්වීමේදී එදිනෙදා අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා විවිධ පුද්ගලයින්ගේ හා විවිධ ආයතනවල සහය ලබා ගැනීමට සිදුවේ. එදිනෙදා අවශ්‍යතා සපයා ගැනීමේ දී අපට සහයවන පුද්ගලයින් තිදෙනෙක් නම් කරන්න.

ii. අවශ්‍යතා ඉටුකරගැනිමේදී සහය වන ආයතනවල කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A. වීදි ලාම්පු නඩත්තු කිරීම.
B. උප්පැන්න සහතික නිකුත් කිරීම.
C. හදිසි අනතුරු වලට ලක්වූවන්ට ප්‍රතිකාර ලබාදීම.
D. නගර පිරිසිදු කිරීම.
E. ග්‍රාම සේවා සහතිකයට අනුමැතිය ලබාදීම.
F. බෝවන හා බෝනොවන රෝග වලින් ආරක්ෂා වීම සඳහා ජනතාව දැනුවත් කිරීම.



ඉහත කරුණු නිවැරදිව තෝරා පහත දැක්වෙන සටහන සම්පූර්ණ කරන්න. (ල.06)

iii. පුද්ගලයාට සේවා ලබාදෙන ආයතන වෙනුවෙන් පුද්ගලයා විසින් ඉටුකළ යුතු යුතුකම් දෙකක් ලියන්න. (ල.02)

07) පහත දැක්වෙන උපකාරක පද උපයෝගී කරගෙන ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.



<u>හරහට</u>

3. මේවා නඩත්තු කිරීම හා පාලනය කිරීම නගර සභාවේ කාර්යයකි.
5. සැලසුම්කරණය නිසා මෙය ඉතිරි වේ.
7. පුද්ගලයෙකු තුළ දක්නට ලැබෙන දුර්වලතාවයකි.
8. කෘෂිකර්මයට විශාල දායකත්වයක් සපයන මෙය ධාතුසේන රජතුමාගේ විශිෂ්ඨ නිර්මාණයකි.
9. පිලිමතලාව මෙම භාණ්ඩ නිෂ්පාදනයට ප්‍රසිද්ධ නගරයක් වේ.
11. සෑම පුද්ගලයෙක්ම ජාතික කොඩියට හා පාසල් කොඩියට මෙය කළ යුතුය.

<u>පහළට</u>

1. සෑම ප්‍රදේශයකම දක්නට ලැබෙන ස්වෙජ්ඡා සංවිධානයකි.
2. සාමූහිකව කටයුතු කිරීමෙන් මෙය ඇතිවේ.
4. මෙවැනි පරිසරයක් ඇතිවීම සම්ප්‍රදායන් ආරක්ෂා කිරීමෙන් සිදුවන වාසියකි.
6. භාෂාව හැසිරවීමේදී මේ පිළිබඳව අවධානය යොමුකළ යුතුය.
10. මේවා පරිහරණය කිරීම සමාජයේ ක්‍රියාත්මක වන නිසරු දෙයකි.

I කොටස

01) ලොග් සටහන් 02) විදුහල්පති 03) ආකල්ප 04) අනධ්‍යයන 05) කළමනාකරණ
06) ✓ 07) × 08) ✓ 09) × 10) ✓ 11) 3
12) 1 13) 4 14) 2 15) 3 16) C.W.W.කන්නන්ගර

17) නිදහස් අධ්‍යාපනයේ පියා

18) එකමුතුකමෙන් / සහයෝගයෙන් කටයුතු කිරීම, නායකත්වයට ගරු කිරීම. / සවන්දීම, අන් අදහස්වලට ගරුකිරීම/සවන් දීම/ ඉවසීම/ අත්දැකීම් බෙදාහදා ගැනීමට හැකිවීම ආදී අදාල පිළිතුරු වලට ලකුණු දෙන්න.

19) සීරීම් / තුවාලවීම් / විෂ සතෙකු දෂ්ට කිරීම වැනි ශ්‍රමදාන අවස්ථාවකදී සිදුවිය හැකි අනතුරු සඳහා ලකුණු දෙන්න.

20) • ක්‍රීඩා කටයුතු සඳහා සම්බන්ධවීම / නිවාසාන්තර ක්‍රීඩා උත්සවය
• ශිෂ්‍ය සාහිත්‍ය සමිති •ගුරු උපහාර වැඩසටහන් සැලසුම් කිරීම • සෞන්දර්ය වැඩසටහන් වලට සම්බන්ධවීම ආදී අදාල පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

II කොටස

01) i. ඇතුලත්වීම් අංකය / ඇතුළත්වූ දිනය / ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම /උපන්දිනය

ii. දිනපතා පාසල් පැමිණීම / හොඳින් ඉගෙන ගැනීම/ විදුහල්පති ඇතුළු ආචාර්යමණ්ඩලයට ගෞරව කිරීම. (පෙළ පොත 8,9 පිටු)

iii. නීතිරීති / සම්ප්‍රදායන් / සිරිත්විරිත් / පාසලේ අනන්‍යතාවය පිළිබිඹුකරන සංකේත

iv. දක්ෂතා - ක්‍රීඩා හැකියා / ගායන හැකියා / නර්තන හැකියා ආදී අදාල කරුණුවලට ලකුණු ලබාදෙන්න.
දුර්වලතා - සිසුන් සමග කළහකිරීම, හොඳින් ඉගෙන නොගැනීම, ගුරුවරුන්ට අවනත නොවීම, ආදී කරුණු සඳහා ලකුණු ලබාදෙන්න.

v. අදාල පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

vi. උදෑසන රැස්වීමේදී / ක්‍රීඩා උත්සව වලදී /ත්‍යාග ප්‍රදානොත්සව වලදී /කලා උළෙල ආදී වෙනත් උත්සව අවස්ථා.

02) i. A ශිෂ්‍ය නායක නායිකා B අංශභාර ගුරුභවතුන්
C නියෝජ්‍ය විදුහල්පති D පාසල් සංවර්ධන කමිටුව

ii. පාසලක පරිපාලන කටයුතු ක්‍රමවත්ව සිදුවීම, සංවර්ධන කටයුතු නිසිලෙස සිදුවීම, පාසල ගුණාත්මක භාවය කරා ගෙනයෑමට හැකිවීම ආදී අදාල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

iii. පාසල් කළමනාකරණ කමිටුව / ක්‍රීඩා කමිටුව / සුභසාධක කමිටුව (පෙළ පොත 9 පිටුව)

03) i. නොමිලේ අධ්‍යාපනය ලබාදීම, නොමිලේ පාසල් පොත් ලබාදීම, නොමිලේ පාසල් නිළ ඇඳුම් රෙදි ලබාදීම, විද්‍යාගාර පහසුකම් ලබාදීම. (පෙළපොත 36 පිටුව)

ii. අධ්‍යාපනය - හොඳින් ඉගෙනීමේ කටයුතුවල නිරතවීම,විනයගරුක වීම, නීතිගරුක වීම ආදී නිවැරදි කරුණු සඳහා ලකුණු ලබාදෙන්න.
සහෝදර සිසු සිසුවියන් ඇසුර - එකම පාසල් මවගේ දරුවන් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීම.
ඔවුන්ගේ සිත් නොරිදවීම.
ඔවුන්ගේ චරිතවලට හානි සිදුවන ලෙස කටයුතු නොකිරීම. (නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.)

04) i. ස්වාභාවික භෞතික සම්පත්

ජලය
කඳු
ගංගා
හිරු එළිය

ස්වාභාවික නොවන භෞතික සම්පත්

මංමාවත්
පාලම්
ගොඩනැගිලි
වාහන

ii. සමාජ අවශ්‍යතා - නිවාස සංකීර්ණ ඉදිවීම, ආහාර අවශ්‍යතා සඳහා වගාකිරීම, කර්මාන්තශාලා ඉදිකිරීම.
ආර්ථික අවශ්‍යතා - වෙළෙඳ කටයුතු ඇරඹීම, සංවර්ධන ව්‍යාපාර ඇරඹීම, කර්මාන්තපුර ඉදිකිරීම.

iii. රුක් රෝපණය කිරීම, පස සංරක්ෂණය සඳහා වැටි බැඳීම, කානු කැපීම, දිරාපත් නොවන ද්‍රව්‍ය පසට එකතු නොකිරීම, ඛණිජ කැණීම් කළ ස්ථාන නැවත ගොඩකිරීම.

05) i. බුද්ධිමය හැකියා - B,E,F කායික හැකියා - A,C, D

ii. කාර්මික විද්‍යාල, වෘත්තිය පුහුණු අධිකාරිය, ජාතික තරුණසේවා සභාව ආදී අදාල පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

iii. හැකියා වැඩිදියුණු කරගත හැකිවීම, වෘත්තිය සුදුසුකම් සපුරා ගැනීම, වෘත්තිය ඉතා හොඳින් කළ හැකිවීම, ආර්ථික වාසි සැලසීම (පෙළපොතේ 58 පිටුව)

06) i. මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා, පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනිය, ග්‍රාමසේවක මහතා, පොලිස් නිලධාරීතුමා, ප්‍රාදේශීය ලේකම්තුමා ආදී අදාල නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

ii. නගර සභාව - A,D ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - B,E රෝහල - C,F

iii. නිසි පරිදි බදු මුදල් ගෙවීම, සේවා සපයන ආයතන හා දේපළ රැකගැනීම, ඔවුන් කරන සේවාවට ගරු කිරීම. (පෙළපොත පිටු අංක 70)

07) i.

හරහට	පහළට
3 මංමාවත්	1 අවමංගල
5 කාලය	2 සමගිය
7 අලසකම	4 සාමකාමී
8 කලා වැව	6 අවස්ථාව
9 පිත්තල	10 මත්වතුර
11 ගරු	

* * * * * *